29550

AL/2021(2022)/25/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021 (2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)

| | |
|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය | I (I කොටස) |
| இலங்கை வரலாறு | I (பகுதி I) |
| History of Sri Lanka | I (Part I) |

25 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

**විභාග අංකය:** ....................................

**උපදෙස්:**

- මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස**, **II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

1. (1) බුන්දල (2) දොරවක (3) යටහලෙන (4) කුදිරමලෙයි (5) කන්දකාඩු (.........)

2. (1) උපතිස්සගාම (2) අනුරාධගාම (3) උරුවේලගාම (4) විජිතගාම (5) පුංඛගාම (.........)

3. (1) සෙරන්ඩිබ් (2) ස්වර්ණභූමි (3) සෙයිලාන් (4) තැප්‍රොබේන් (5) පලෙසිමුණ්ඩු (.........)

4. (1) ගහපති (2) භූපති (3) පයවිපති (4) මහීපති (5) පෘථුවීශ්වර (.........)

5. (1) රත්නාවලී (2) කල්‍යාණවතී (3) ලීලාවතී (4) සමුද්‍රදේවී (5) තිලෝකසුන්දරී (.........)

6. (1) ගඟසිරිපුර (2) සෙංකඩගල (3) කන්දේනුවර (4) කටුපුළුනුවර (5) සිරිවඩ්ඩනපුර (.........)

7. (1) ජෙරනිමෝ ද අසවේදු (2) ජෝර්ජ් ද අල්මේදා (3) ලොරෙන්සෝ ද අල්මේදා (4) නූනෝ අල්වාරෙස් පෙරෙයිරා (5) ජෝර්ජ් ද ඇල්බකර්ක් (.........)

8. (1) රයික්ලෝෆ් ෆන් හූන්ස් (2) යාන් ෂ්‍රොයිඩර් (3) යාන් මට්සුයිකර් (4) විලෙම් ෆන් ඉම්හොෆ් (5) ජෝරිස් ෆන් ස්පිල්බර්ජන් (.........)

[දෙවැනි පිටුව බලන්න.

9. (1) හතර කෝරළය (2) හත් කෝරළය (3) සපරගමුව
(4) නුවරකලාවිය (5) උඩුනුවර (.........)

10. (1) ඩී.එස්. සේනානායක (2) ජෝන් කොතලාවල (3) ඩබ්. දහනායක
(4) සිරිමා ආර්.ඩී. බණ්ඩාරනායක (5) විලියම් ගොපල්ලව (.........)

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ.** එම **නො ගැළපෙන** යුගලය කුමක්දැ'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) දේවානම්පිය තිස්ස රාජ්‍ය සමය - සංඝමිත්තා තෙරණිය
(2) මහසෙන් රාජ්‍ය සමය - සංඝමිත්ත ථෙර
(3) සිරිමේඝවණ්ණ රාජ්‍ය සමය - හේමමාලා සහ දන්ත
(4) මහානාම රාජ්‍ය සමය - ෆාහියන් ථෙර
(5) ධාතුසේන රාජ්‍ය සමය - හියුන්සාං ථෙර (.........)

12. (1) තුන්වැනි විජයබාහු - දඹදෙණිය රාජධානියේ පළමුවැනි පාලකයා
(2) සේනා සම්මත වික්‍රමබාහු - උඩරට රාජධානියේ පළමුවැනි පාලකයා
(3) පළමුවැනි රාජසිංහ - සීතාවක රාජධානියේ පළමුවැනි පාලකයා
(4) විලෙම් ජේ. කොස්ටර් - ශ්‍රී ලංකාවේ පළමුවැනි ලන්දේසි ආණ්ඩුකාරවරයා
(5) ෆ්‍රෙඩ්රික් නෝර්ත් - ශ්‍රී ලංකාවේ පළමුවැනි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා (.........)

13. (1) තිරු කෝනේශ්වරම් කෝවිල - ත්‍රිකුණාමලය
(2) තිරුකේතීශ්වරම් කෝවිල - මන්නාරම
(3) මුන්නේශ්වරම් කෝවිල - හලාවත
(4) බැරැණ්ඩි කෝවිල - සීතාවක
(5) තිරුක්කෝවිල් - නල්ලූර් (.........)

14. (1) රොබට් බ්‍රවුන්රිග් - උඩරට රාජ්‍යය යටත් කිරීම
(2) තෝමස් මේට්ලන්ඩ් - රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
(3) එඩ්වර්ඩ් බාන්ස් - කොළඹ-නුවර මාර්ගය ඉදිකිරීම
(4) ආතර් ගෝර්ඩන් - කලාවැව ප්‍රතිසංස්කරණය කිරීම
(5) ආතර් හැව්ලොක් - ධාන්‍ය බද්ධ අවලංගු කිරීම (.........)

15. (1) සයිව ප්‍රගාස සබෛයි - ආරුමුග නාවලර්
(2) පරම බෞද්ධ විඥානාර්ථ සමාගම - හෙන්රි ස්ටීල් ඕල්කට්
(3) රාම ක්‍රිෂ්ණ මිසම - ස්වාමි විවේකානන්ද
(4) මහා බෝධි සමාගම - අනගාරික ධර්මපාල
(5) රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන - හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි (.........)

● අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ. Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

16.

| X | | Y | |
|---|---|---|---|
| (i) | ප්ලිනි | A | ශ්‍රී ලංකාව දැක්වෙන මුල්ම සිතියම |
| (ii) | ටොලමි | B | රෝමයට ගිය ශ්‍රී ලාංකේය දූත ගමනක් පිළිබඳ විස්තරය |
| (iii) | ෆාහියන් | C | යාපන රාජධානිය පිළිබඳ තොරතුරු |
| (iv) | කොස්මස් | D | අභයගිරි විහාර දළදා පෙරහැර පිළිබඳ විස්තර |
| (v) | ඉබන් බතූතා | E | පුරාණ ශ්‍රී ලංකාවේ වෙළෙඳාම පිළිබඳ විස්තර |

(1) ABCED (2) BADEC (3) CBAED (4) DAEBC (5) DBCEA (.........)



Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka



**17.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | සාරාර්ථ සංග්‍රහය | A | ගම්පොළ යුගය |
| (ii) | පූජාවලිය | B | කෝට්ටේ යුගය |
| (iii) | මයුර සංදේශය | C | දඹදෙණි යුගය |
| (iv) | කාව්‍යශේඛරය | D | පොළොන්නරු යුගය |
| (v) | බුත්සරණ | E | අනුරාධපුර යුගය |

(1) AECBD (2) CEDBA (3) DEBCA (4) EBADC (5) ECABD (.........)

**18.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | පළමු වන රාජරාජ | A | චීන |
| (ii) | මාඝ | B | පාණ්ඩ්‍ය |
| (iii) | චන්ද්‍රබානු | C | කාලිංග |
| (iv) | ජටාවර්මන් | D | චෝළ |
| (v) | චෙංහෝ | E | ජාවක |

(1) BADEC (2) BDCAE (3) DCEBA (4) DBECA (5) ECBAD (.........)

**19.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ඔවිඩෝර් | A | කණිෂ්ඨ වෙළෙන්දා |
| (ii) | මහබද්දේ කපිතාන් | B | ආදායම් කටයුතු භාර නිලධරයා |
| (iii) | ඔන්ඩර් කුප්මන් | C | විනිශ්චයකාරවරයා |
| (iv) | විඩෝර් ද පසෙන්ඩා | D | ජ්‍යෙෂ්ඨ වෙළෙන්දා |
| (v) | ඔපර් කුප්මන් | E | කුරුඳු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා |

(1) BEACD (2) CAEBD (3) CBDAE (4) DBECA (5) EBADC (.........)

**20.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | එමර්සන් ටෙනන්ට් | A | පුරාතන ලංකාව |
| (ii) | මේජර් ෆෝබ්ස් | B | ලංකාව |
| (iii) | තෝමස් ස්කිනර් | C | වන ප්‍රවාහය |
| (iv) | ජෝන් ස්ටීල් | D | ලංකාවේ එකොළොස් වසක් |
| (v) | හෙන්රි පාකර් | E | ලංකාවේ පනස් වසක් |

(1) ABCED (2) BCDAE (3) BADEC (4) BDECA (5) EBDAC (.........)

● අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21.** **පුරාතන වාරි කර්මාන්ත**

(1) දේවානම්පිය තිස්ස රජු නුවරවැව ඉදි කළේ ය.
(2) වසභ රජුගේ කාලයේ දී විශාල වැව් ඉදිකිරීම ආරම්භ විය.
(3) පෞද්ගලික අයිතිය යටතේ ද වැව් පැවතුණි.
(4) තිසා වැව සහ කලා වැව සම්බන්ධ කළ ඇළ මාර්ගය ජය ගඟ නමින් හැඳින්විණි.
(5) පළමුවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමය වාරි කර්මාන්තයේ උච්චතම අවස්ථාව සනිටුහන් කරයි. (.........)

**22.** **නිශ්ශංකමල්ල රජු මුහුණ දුන් අභියෝග**

(1) ගොවිකුල ජනයාගේ විරෝධතා
(2) කාලිංග වංශිකයෙකු වීම
(3) පාණ්ඩ්‍ය වංශිකයින් සිහසුනට උරුමකම් කීම
(4) පූර්ව පාලන සමයන්හි ඉහළ තනතුරු දැරූ අයගෙන් එල්ල වූ බලපෑම
(5) සහස්සමල්ලගෙන් එල්ල වූ තර්ජන (.........)

Department of Examinations Sri Lanka

**23.** **ලන්දේසි ආගමික ප්‍රතිපත්තිය**

(1) පාසැල් හා පල්ලි මගින් ආගම ප්‍රචාරය කිරීම
(2) රෙපරමාදු ආගමට පමණක් අනුග්‍රහය දැක්වීම
(3) වහකෝට්ටේ දේවස්ථානයට ප්‍රමුඛස්ථානය ලබාදීම
(4) රෝමානු කතෝලික ආගම මර්දනය කිරීම
(5) සිවිල් පරිපාලනයේ ඉහළ තනතුරු රෙපරමාදු ආගම ඇදහූ අයට පමණක් ලබාදීම (.........)

**24.** **කෝල්බෲක්-කැමරන් කොමිසමෙහි නිර්දේශ**

(1) රාජකාරිය අවලංගු කිරීම
(2) වැටුප් ගෙවීම වෙනුවට ඉඩම් ලබා දීම
(3) ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීම
(4) ඒකීය අධිකරණ ක්‍රමයක් ස්ථාපිත කිරීම
(5) ව්‍යවස්ථාදායක සහ විධායක සභා පිහිටුවීම (.........)

**25.** **පොන්නම්බලම් අරුණාචලම්**

(1) දේශපාලන ප්‍රතිසංස්කරණ ගැන විශේෂ උනන්දුවක් දැක්වූවෙකි.
(2) මෙරට විශ්වවිද්‍යාලයක් පිහිටුවීමේ අවශ්‍යතාව කෙරෙහි අවධානය යොමු කළේ ය.
(3) ලංකා ජාතික සංගමයේ පළමු සභාපතිවරයා ය.
(4) යාපන විශ්වවිද්‍යාලය පිහිටුවීමට මුල් වූ තැනැත්තා ය.
(5) ලංකා සිවිල් සේවයෙහි නිරත වූ කෙනෙකි. (.........)

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,
**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ......... **5** ද, **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26.** පළමුවැනි විජයබාහු රජු සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) පළමුවැනි විජයබාහු රජු තරුණ වියේදී කළිඟු කුමරු නමින් හඳුන්වනු ලැබීය.
(B) පළමුවැනි විජයබාහුගේ දියණිය පාණ්ඩ්‍ය කුමාරයෙකු හා විවාහ වූවාය.
(C) පනාකඩුව තඹ සන්නසින් පළමුවැනි විජයබාහු මුහුණදුන් දුෂ්කර සමය පිළිබඳව තොරතුරු අනාවරණය වේ.
(D) පළමුවැනි විජයබාහු රජු බුදල්නාවන්ට විශේෂ වරප්‍රසාද ලබා දී තිබුණි. (.........)

**27.** යාපහුව රාජධානිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) යාපහුව සුභ පබ්බත නමින් හඳුන්වනු ලැබීය.
(B) පළමුවැනි බුවනෙකබාහු යාපහුවේ ප්‍රථම රජතුමා විය.
(C) මාර්කෝ පෝලෝ යාපහුව රජමාළිගය ගැන අගනා විස්තරයක් ඉදිරිපත් කොට තිබේ.
(D) දළදා වහන්සේ බෙලිගල සිට යාපහුවට වැඩම කරවනු ලැබීය. (.........)

**28.** දහනවවැනි සියවසේ දී ඇති වූ සංස්කෘතික පුනර්ජීවනය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) සූරියමල් ව්‍යාපාරය බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයෙහි මූලිකත්වය ගෙන කටයුතු කළේ ය.
(B) අනගාරික ධර්මපාලගෙන් බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයට විශාල දායකත්වයක් ලැබුණි.
(C) ආරුමුග නාවලර්ගේ මූලිකත්වයෙන් හින්දු පුනරුදය ආරම්භ විය.
(D) ඒ. සී. ඇස්. හමීඩ්ගේ මූලිකත්වයෙන් ඉස්ලාම් ආගමික පුනරුදය ආරම්භ විය. (.........)

**29.** අමද්‍යප ව්‍යාපාරය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) බ්‍රිතාන්‍ය පාලකයින් මෙරටදී අනුගමනය කළ සුරා බදු ප්‍රතිපත්තියට එරෙහිව අමද්‍යප ව්‍යාපාරය ආරම්භ විය.
(B) බ්‍රහ්මචාරී වලිසිංහ හරිශ්චන්ද්‍ර අමද්‍යප ව්‍යාපාරයේ පළමුවැනි සභාපතිවරයා විය.
(C) හාපිටිගම කෝරළයේ පැවති අමද්‍යප සංවිධානය ඉතා ක්‍රියාශීලී එකක් විය.
(D) ජේම්ස් ද අල්විස් අමද්‍යප ව්‍යාපාරයේ පුරෝගාමියෙකි. (.........)

**30.** 1972 ජනරජ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ජනාධිපතිවරයා නාමික විධායකය ලෙස කටයුතු කිරීම
(B) ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකයක් පිහිටුවීම
(C) ජනාධිපතිවරයා දෝෂාභියෝගයකින් ඉවත් කළ හැකිවීම
(D) ජනතා දුක් ගැනවිලි වෙනුවෙන් ඔම්බුඩ්ස්මන්වරයෙකු පත් කිරීම (.........)

● අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** සිරිමේඝවණ්ණ යනු මහසෙන් රජුගේ පුත්‍රයා බවට තහවුරුවන සෙල්ලිපිය කුමක් ද?
(1) හබැස්ස සෙල්ලිපිය (2) පාලුමැකිච්චාව සෙල්ලිපිය (3) තෝනිගල සෙල්ලිපිය
(4) වේවැල්කැටිය සෙල්ලිපිය (5) බදුල්ල ටැම් ලිපිය (.........)

**32.** ශ්‍රී ලංකාවේ අවසන් සිංහල රජු වශයෙන් සැලකෙන්නේ කවරෙක් ද?
(1) සෙනරත් රජතුමා (2) ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා
(3) ශ්‍රී විජය රාජසිංහ රජතුමා (4) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
(5) රාජාධිරාජසිංහ රජතුමා (.........)

**33.** හලාවත සංගමයේ ප්‍රථම සභාපතිවරයා වූයේ කවරෙක් ද?
(1) ඩබ්. ඇෆ්. ගුණවර්ධන (2) ආනන්ද කුමාරස්වාමි
(3) ජේම්ස් පීරිස් (4) ඊ. ඩබ්. අදිකාරම්
(5) වික්ටර් කොරයා (.........)

**34.** කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවන ලද්දේ කවරෙකු විසින් ද?
(1) බද්-උද්දීන්-මහ්මුද් (2) අබ්දුල් කාදර්
(3) ටී. බී. ජයා (4) එම්. සී. සිද්දි ලෙබ්බේ
(5) ඒ. එච්. එම්. ඉස්මයිල් (.........)

**35.** ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනයේ පියා යනුවෙන් හඳුන්වනු ලබන්නේ කවරෙක් ද?
(1) ඊ. ඒ. නුගවෙල (2) සී. ඩබ්. ඩබ්. කන්නන්ගර (3) රිචඩ් අලුවිහාරේ
(4) එම්. ඩී. බණ්ඩා (5) පිලිප් ගුණවර්ධන (.........)



Department of Examinations Sri Lanka

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා, එට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | ශ්‍රී ලංකාවේ භික්ෂූන් අතර පළමු නිකාය භේදය මහසෙන් රජුගේ කාලයෙහි දී සිදුවිය. | මහසෙන් රජතුමා අභයගිරිය සාදා එය සංඝමිත්ත තෙරුන්ට පූජා කිරීම ශ්‍රී ලංකාවේ සිදු වූ පළමුවන නිකාය භේදය සලකුණු කරයි. | (.........) |
| **37.** | චෝරනාග යනු බෞද්ධ වෙහෙර විහාර ගණනාවක් කොල්ල කෑ පාලකයෙකි. | වසභ රජුගේ කාලයට අයත්වන සෙල්ලිපි දිවයිනේ විවිධ පළාත්වලින් හමු වී තිබේ. | (.........) |
| **38.** | ලංකාවේ අවසන් ලන්දේසි ආණ්ඩුකාරවරයා වූයේ ජේ. ජී. ෆන් අංගල්බෙක් ය. | උඩරට රජුගේ සිරකරුවකු වූ රොබට් නොක්ස් එළදැත්ත හා බණ්ඩාරකොස්වත්ත යන ප්‍රදේශවල දිගු කාලයක් වාසය කළේය. | (.........) |
| **39.** | ප්‍රධාන වශයෙන් දේශපාලනික සහ ආර්ථික හේතු මුල් කොටගෙන දහනව වැනි සියවසෙහි දී බ්‍රිතාන්‍ය පාලකයෝ මාර්ග පද්ධතියක් ගොඩනැඟූහ. | ගමනාගමනය පහසු කිරීමට, වතුවගාව ඇතුලු ආර්ථික කටයුතු වර්ධනය කිරීමට හා උඩරට ප්‍රදේශයන්හි පාලනය කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාමට මහාමාර්ග ඉදිකිරීම අත්‍යවශ්‍ය බව එකල බ්‍රිතාන්‍ය පාලකයෝ හොඳින් වටහා ගෙන සිටිය හ. | (.........) |
| **40.** | හජ්ජි මරික්කාර් මුහන්දිරම්වරයෙකු වශයෙන් පත් කිරීම 1915 සිංහල-මුස්ලිම් කෝලාහලයට තුඩුදුන් ආසන්නතම හේතුව විය. | 1915 සිංහල-මුස්ලිම් කෝලාහලය පිළිබඳ නඩුව පෝල් ඊ. පීරිස් ඉදිරියේ දී විභාග කරන ලදී. | (.........) |

* *



Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka


අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ශ්‍රී ලංකා ඉතිහාසය I
இலங்கை வரலாறு I
History of Sri Lanka I

25 S

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

විභාග අංකය / சுட்டெண் / Index No. ...............................




Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka

29549



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය | I (II කොටස) | 25 S I |
| இலங்கை வரலாறு | I (பகுதி II) | |
| History of Sri Lanka | I (Part II) | |

**ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

**උපදෙස්:**

※ **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.

※ **පළමුවන** ප්‍රශ්නයටත් **B** හා **C** කොටස්වලින් අවම වශයෙන් **එක** ප්‍රශ්නය බැගින් තෝරාගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | | |
|---|---|---|---|
| (i) එලිෆන්ට්පාස් | (ii) ගොඩවාය | (iii) කිරිඳි ඔය | (iv) වයඹ පළාත |
| (v) කල්පිටිය | (vi) කළුතර | (vii) ඇඳුරුඔය | (viii) යෝධ වැව |
| (ix) කොළඹ | (x) බලන | (xi) සේනානායක සමුද්‍රය | (xii) මාතර |

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

## B කොටස

**2.** පොළොන්නරු යුගයේ අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩගැස්වීමෙහි ලා බාහිර භූගෝලීය සාධක බලපෑ අයුරු පහත දැක්වෙන තේමා යටතේ පරීක්ෂා කරන්න.

(i) ඉන්දියාව ආසන්නයේ පිහිටා තිබීම

(ii) ඉන්දියන් සාගරයේ මධ්‍යගත ස්ථානයක පිහිටා තිබීම (ලකුණු 16 යි)

**3.** "කාවන්තිස්ස රජතුමා විසින් දමනු ලැබූ පදනම මත දුටුගැමුණු රජු දිවයිනෙහි දේශපාලන එක්සත්භාවයක් ඇති කළේ ය."

(i) මාගම රාජධානියේ ආරම්භක පාලකයා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) කාවන්තිස්ස රජුගේ සමීපතම පූර්වගාමී පාලකයන් **දෙදෙනා** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) කාවන්තිස්ස රජුගේ කාර්ය සාඵල්‍යය සැකෙවින් දක්වන්න. (ලකුණු 05 යි)

(iv) දුටුගැමුණු රජතුමාගේ දේශපාලන කාර්ය සාඵල්‍යය විචාරාත්මකව විමසන්න. (ලකුණු 08 යි)

**4.** රජරට ශිෂ්ටාචාරයේ පරිහානියට හා බිඳවැටීමට තුඩුදුන් ප්‍රධාන සාධක විවේචනාත්මකව විමසන්න. (ලකුණු 16 යි)

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) වසභ රජතුමා

(ii) පළමුවන විජයබාහු රජතුමා විසින් රජරට චෝළ ආධිපත්‍යයෙන් මුදවා ගැනීම

(iii) දඹදෙණි සමයේ සංස්කෘතිය

(iv) ආර්යචක්‍රවර්ති පෙළපත

(ලකුණු 08 × 2 = 16 යි)

අටවැනි පිටුව බලන්න.

## C කොටස

**6.** පෘතුගීසීන් මුහුදුබඩ පළාත්වල සිය බලය ස්ථාපිත කරගත් ආකාරය පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ පරීක්ෂා කරන්න.

(i) කෝට්ටේ රාජ්‍යය තුළ ස්වකීය බලය පිහිටුවා ගැනීම (ලකුණු 10 යි)

(ii) යාපනය රාජධානිය යටත්කර ගැනීම (ලකුණු 06 යි)

**7.** කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ කාර්යය සාඵල්‍යය පහත දැක්වෙන තේමා යටතේ සාකච්ඡා කරන්න.

(i) ලන්දේසීන් සමඟ සම්බන්ධතා

(ii) බෞද්ධ පුනර්ජීවනය (ලකුණු 16 යි)

**8.** "ඩොනමෝර් ආණ්ඩුක්‍රමය, බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම වර්ධනයේ වැදගත් ඉදිරි පියවරක් සලකුණු කරයි."

(i) ඩොනමෝර් කොමිසම පැමිණෙන විට ලංකාවේ සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) ඩොනමෝර් සාමි හැර එම කොමිසමේ සිටි සෙසු කොමසාරිස්වරුන් **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) යටත්විජිත ආණ්ඩුවට ඩොනමෝර් කොමිසම පත් කිරීමට තුඩුදුන් සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

(iv) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ ඇසුරෙන් එහි වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 09 යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) දහනවවන සියවසේ කෝපි වතු වගාව

(ii) 1848 බ්‍රිතාන්‍ය විරෝධී අරගලය

(iii) ඩී. එස්. සේනානායක

(iv) ජනසතු ව්‍යාපාරය

(ලකුණු 08 × 2 = 16 යි)

* * *

Department of Examinations Sri Lanka